# හජ් සහ උම්රා ඉටුකරන්නේ කෙසේද?

සෙයික් මුහම්මද් අස්සාලිහ් අල් උතෛමීන්

සිංහල පරිවර්තනය:
එස්. එම්. මන්සූර්

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالسلي
ص.ب ١٤١٩ الرياض ١١٤٣٠ هاتف ٢٤١٤٤٨٨ ـ ٢٤١٠٦١٥ ناسوخ ٢٤١١٧٢٢

سنهالي ١ / ٥

# හජ් සහ උම්රා ඉටුකරන්නේ කෙසේද?

සෙයික් මුහම්මද් අස්සාලිහ් අල් උතෛමීන්

සිංහල පරිවර්තනය
එස්. එම්. මන්සූර්.

ප්‍රකාශනය
කැඳවීමේ සහ මගපෙන්වීමේ සහයෝගී කාර්යාලය
අල් බදීයා - සමාජ ඒකකය
රියාද්
සවුදි අරාබියාව

# පෙරවදන

ඉස්ලාමයෙහි වූ අනිවාර්ය කාර්යයන් අතර හජ් කර්තව්‍යයද එකක් වේ. මෙම කර්තව්‍යය ඉටු කිරීමට උවමනා මුදල් ද, ශරීර සෞඛ්‍යද ඇති අය මෙය ඉටුකළ යුතුමය.

නොයෙක් ආගම් හා මිනිසුන් අතර මෙවැනි කර්තව්‍යයන් ඇතත් මෙය ඒවායෙහි විශේෂ තැනක් ගනියි. ලොවෙහි එක් කොණක සිට අනෙක් කොණ දක්වා වෙසෙන මුස්ලිම්වරුගෙන් ලක්ෂ සංඛ්‍යාත ගණනක් තම ජාති, භාෂා, දේශ, වර්ණ භේදවලින් තොරව, අල්ලාහ්ගේ ආරාධනාව පිළිගෙන මෙම ගමන එයි.

මක්කමට සමීපව ඇති යම් ස්ථානයක් දක්වා ම තම තමන්ගේ සංස්කෘතියට අයත් ඇඳුම් පැළඳුම් වලින් සැරසී එන මොවුන්, එතැනදී සුදෝ සුදු ඇඳුම් ඇඳ "ලෙබ්බයික් අල්ලාහුම්ම ලෙබ්බයික්" යනු එකම භාෂාවකින් ශබ්ද නගා කියමින් මක්කමට ඇතුල්වෙයි: උරෙන් උර ගැටී සලාහ් කරයි; අනෙක් කාර්යයන් ද හැකි තරම් යහපත් ව ඉටු කරයි.

අද ඊයේ පමණක් නොව, දීර්ඝ කාලයක් මෙම කර්තව්‍යය මෙසේ කෙරීගෙන තිබීම මෙහි ඇති ශ්‍රේෂ්ඨත්වයට කදිම නිදසුනකි.

රමදානයේ ආරම්භයේ සිටම පිවිතුරු චේතනාවකින් යුතුව පටන් ගැනුනු ඉස්ලාමීය ක්‍රියාවලිය ටිකින්ටික වැඩී, හජ් සමයේ දී එය ඉතා උසස් තත්වයකට එළඹ

එයි. එම අවස්ථාවේ මුළු මුස්ලිම් සංහතියම තම නියෝජිතයන් තෝරා මක්කමට යවා ජාත්‍යන්තර මුස්ලිම් සම්බන්ධතාවය තර කරයි.

ඇත්ත වශයෙන්ම, හජ් හි ඇති උතුම්භාවය හා අපරිමිත වූ ප්‍රයෝජනයන් හරියාකරවම දැනගත හැක්කේ එම ගමනෙහි යෙදී, එය නිසි පිළිවෙලට ඉටුකළොත් පමණකි. මෙය ඒ සඳහා වූ උපදෙස් අඩංගු අත් පොතකි.

ශාස්ත්‍ර විශාරද සෙයික් මුහම්මද් අස්සාලිහ් අල් උතෙමීන් තුමාගේ කෘතියක් වූ "සිෆාත් අල්හජ් වල් උම්රාහ්" පොත් පිංචයේ පරිවර්තනයකි මෙය. හජ් කර්තව්‍යයෙහි යෙදෙන අයට මෙය ඉතා ප්‍රයෝජනවත් වනවාට නොඅනුමානය. එවැන්නන්ට මෙම කර්තව්‍යයෙහි යෙදී දෙලොව භාග්‍යයන් ලැබිය යුතුය යන්න අපගේ ප්‍රාර්ථනාව වේ.

ප්‍රශංසා සියල්ල අල්ලාහ්ට හිමිය. ශාන්තිය සමාදනය හා සියලු ආශිර්වාදයන් නබි (සල්) තුමාණන්ටත්, එතුමාගේ නෑදෑ හිතමිතුරන්, අනුගාමිකයන්ටත්, එතුමාගේ ආදර්ශය අනුව සැමදින ජීවත්වන්නන්ටත් ලැබේවා.

ප්‍රකාශකයෝ

**25-11-1993**

රියාද්

සවුදි අරාබියාව

මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

# 1. චේතනාව

විශ්වයේ අධිපති වූ අල්ලාහ්ට සියලු ප්‍රශංසා හිමිය. වක්තෘ (නබි) වරුන්ගෙන් අවසානව පැමිණි මුහම්මද් (සල්) තුමාට හා එතුමාගේ පවුලේ අය, අනුගාමිකයන්ටද අල්ලාහ්ගේ සාමය හා ආශීර්වාදය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

හජ් කර්තව්‍යය වනාහි ඉතා උතුම් නැමදුමකි. අල්ලාහ් විසින් අනිවාර්ය කරනු ලැබ, මුහම්මද් (සල්)[1] තුමා විසින් ඉටු කරනු ලැබූ ඉස්ලාමයේ ප්‍රධාන කුළුණකි. මෙය ඉටුකිරීමට අවශ්‍ය සුදුසුකම් ඇත්තෙකු, මෙය ඉටු නොකළේනම්, ඔහුගේ ආගමික (ඉස්ලාමික) ජීවිතය පරිපූර්ණ නොවේ.

මෙම කර්තව්‍යය ඉටුකරනවිට අපකාගේත් චේතනාවන් පිරිසිදු විය යුතුය. විශේෂයෙන් පහත සඳහන් කරුණු දෙක ගැන සැලකිළිමත් විය යුතුය.

1. මරණින් පසු වූ ජීවිතයේ අභිලාෂය තකා අල්ලාහ් වෙනුවෙන් පමණක් එය ඉටුකළ යුතුය. මේ හැර, මිනිසුන් අතර කැපී පෙනීමේ අදහසින් හෝ ලෞකික ආදායමක් ලබාගැනීමේ අරමුණක් ඇතිව හෝ මෙය ඉටු නොකළ යුතුය.
2. මෙය ඉටුකරන විට මුහම්මද් (සල්) තුමාගේ

---

1. 'සල්' - 'සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම්' යනු සම්පූර්ණයෙන් කියන්න.

ආදර්ශය අනුගමනය කළ යුතුය. සුන්නාහ් හෙවත් මුහම්මද් (සල්) තුමාගේ ආදර්ශය නොදැන මෙය ඉටුකළ නොහැක්කකි. එමනිසා එය දැනගැනීම මෙම කර්තව්‍යය නිසියාකාරව ඉටුකිරීමට ඉවහල් වෙයි.

# ක්‍රම තුනක්

හජ් කර්තව්‍යය ඉටුකිරීමට ක්‍රම තුනක් ඇත. මේ තුන "අත් තමත්තු, "අල් ඉෆ්රාද්", "අල් කිරාන්" නම් වේ.

**අත්තමත්තු** : යමෙකු හජ් මාසය තුළ උම්රා නම් වූ කර්තව්‍යය ඉටුකිරීමට පමණක් ඉහ්රාම්[2] අඳියි. පසුව ඔහු මක්කමට ළඟාවූ විට උම්රා වෙනුවෙන් තවාෆ්[3] සහ සයී[4] ඉටු කරයි. ඉන්පසු තම හිසකෙස් බූ ගෑමීම හෝ කොටට කැපීම හෝ කරයි. ඉනික්බිතිව දුල් හජ් මස අටවෙනි දින, එනම්, "තර්වියා" දින, හජ් වෙනුවෙන් පමණක් ඉහ්රාම් ඇඳ එයට අදළ කාර්‍යයන් සම්පූර්ණයෙන් ඉටුකරයි.

---

2. ඉහ්රාම් - හජ් හෝ උම්රා කර්තව්‍යයන් ඉටුකරනවිට අඳින ඇඳුම
3. තවාෆ් - කෑබාව වටේ හත්වරක් ගමන් කිරීම
4. සයී - සෆා හා මර්වා කඳුගැට අතර හත්වරක් ගමන් කිරීම.

**අල් ඉෆ්රාද්** : යමෙකු හජ් කර්තව්‍යය වෙනුවෙන් පමණක් ඉහ්රාම් අදියි. ඔහු මක්කාවට පැමිණි විට එහි ආ වෙනුවෙන් තවාෆ් ද, හජ් වෙනුවෙන් සයී ද ඉටුකරයි. ඔහු ඉහ්රාමයෙන් ඉවත් නොවූ නිසා හිසකෙස් බූ ගෑයීම හෝ කැපීම හෝ නොකරයි. තවද, ඊද්[5] දිනයෙහි ජම්රතුල් අඛබාවේදී[6] ගල් ගැසීම දක්වාම ඉහ්රාම් ඇඳුම සමග සිටියි. හජ් වෙනුවෙන් තවාෆ් ඉටුකිරීම නිමවන දක්වා ම සයී ඉටුකිරීම පමාකිරීමට ඔහුට අනුමතිය ඇත.

**අල් කිරාන්** : යමෙකු උම්රා සහ හජ් වෙනුවෙන් ඉහ්රාම් අදියි. නැතහොත් ඔහු පළමුවෙන් උම්රා වෙනුවෙන් ඉහ්රාම් ඇඳ, දෙවනුව හජ් වෙනුවෙන් තවාෆ් කිරීමට පෙර හජ් කර්තව්‍යය සඳහා නියියත්[7] කරයි. එකම එක වෙනසක් හැර ඉෆ්රාද් ක්‍රමය හා කිරාන් ක්‍රමයෙහි කෙරෙන කර්තව්‍යයන්හි කිසිම වෙනසක් නැත. එම වෙනස නම් කිරාන් ක්‍රමය අනුගමනය කරන්නා සතෙකු කැපකරයි. ඉෆ්රාද් ක්‍රමය අනුගමනය කරන්නා මෙය නොකරයි. මෙය මොහුට අනිවාර්ය නැත.

ඉහත සඳහන් ක්‍රම තුනෙන් ම 'තමත්තු' ඉතා

---

5. ඊද් : මුස්ලිම්වරුන්ගේ උත්සව දිනයක්

6. ජම්රතුල් අඛබා : මක්කමට ඉතා ලඟින් ඇති ස්මාරකය

7. නියියත් : චේතනාව, යමක් කිරීමට පෙර එය ගැන සිත්හි ඇති කරගන්නා තීරණය.

උසස්ය. නබි මුහම්මද් (සල්) තුමා මෙම ක්‍රමය අනුව තම කර්තව්‍යයන් ඉටුකරන ලෙස තම අනුගාමිකයන්ට අනුබල දුන්හ. සමහරවිට, යම් කෙනෙකු කිරාන් හෝ ඉෆ්රාද් ක්‍රමයන් අනුව තම කර්තව්‍යයන් ඉටුකිරීමට නියියත් කරසිටියේ නම් එම නියියතය තමත්තු බවට මාරු කරගැනීමට අවසර ඇත. තවාෆ් සහ සයී ඉටුකිරීමෙන් පසුවද මෙම වෙනස කිරීමට පුළුවන.

නබි (සල්) තුමා තම සමුගැනීමේ හජ් කර්තව්‍යය තම අනුගාමිකයින් සමග ඉටුකළ වසරෙහි තවාෆ් සහ සයී ද ඉටු කළහ. එවිට, කැපකිරීම සඳහා සතුන් නොගෙනා අය තම හජ් සඳහා වූ නියියතය උම්රා සඳහා වූ නියියතය ලෙස මාරුකරගෙන තම හිසකෙස් කපන අතර හජ් කර්තව්‍යය දක්වා ඉහ්රාම් අත් හරින ලෙස ද එතුමා නියෝග කළහ.

තවද, "මමත් කැපකිරිම සඳහා සතෙක් නොගෙනාවෙහි නම් ඔබට නියෝග කළ පරිද්දෙන්ම කටයුතු කරන්නෙක් මි" යයි නබි (සල්) තුමා පැවසුහ.

# 2. උම්රා

උම්රා ඉටුකරන්නෙක් චාරිත්‍රයක් වශයෙන් පිරිසිදුව සිටීමට අවශ්‍යයයි සිතන්නේ නම්, පහසු නම් ලිංගික ආශ්වාදයකින් පසුව කෙසේ ජලස්නානය කරන්නේ ද එලෙස කළ යුතුයි. අනතුරුව ඉස්තරම් සුවඳ විලවුන් ගෙන තම හිස හා රැවුල ආලේප කළ යුතුයි. ඉහ්රාම් ඇඳගත් පසුව ද එම සුවඳ විලවුන් වලින් පිටවෙන සුගන්ධය තිබීම වරදක් නොවෙයි.

ඉහ්රාම් සඳහා ජලස්නානය කිරීම ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම පිළිපැදිය යුතු සුන්නාහ්වකි.ඔසප් වීම සහ දරු ප්‍රසූතයෙන් පසුව ලේ පිටවීම යනාදියට භාජනය වූ ස්ත්‍රීන් පවා ජලස්නානය කිරීම සුන්නාහ්වට අයත් ය. ජලස්නානයෙන් පසුව, ඔසප් වූ හා දරු ප්‍රසූතයෙන් පසු ලේ පිටවෙන ස්ත්‍රීන් හැර අන් අය, එය අනිවාර්‍ය සලාත් ඉටුකරන වේලාවක් නම් වහාම එය ඉටුකළ යුතුය. නැතහොත් වුළු [9] කිරීමෙන් යුතුව සුන්නත් සලාත්[10] රකඅත්[11] දෙකක් ඉටුකළ යුතුය.

---

8. සුන්නාහ් : නබි මුහම්මද් (සල්) තුමාගේ ආදර්ශමත් ජීවිතයට මෙම නම යෙදේ.

9. වුළු : සලාත් සඳහා කරන ශෞචනයට මෙම නම යෙදේ.

10.. 'සුන්නත් සලාත්' යනු අනිවාර්‍ය නොවන සලාත්වලට කියනු ලැබේ.

11. රකඅත් : සලාතයේ එක් වටයකට මෙම නම යෙදේ.

මෙම සලාතය ඉටුකිරීමෙන් පසු ඔහු "ලෙබ්බයික්ක උම්රතන්"[12] යනු මුවින් කියා නියියත් තබාගත යුතුයි. එතැන්සිට පහත සඳහන් වාක්‍යයන් විටින්විට ශබ්ද නගා කියයුතුයි. පිරිමින් මෙය ශබ්ද නගා කියන අතර ස්ත්‍රීන් තමන් ලඟ සිටින කෙනෙකුට පමණක් ඇසෙන සේ කීම සෑහේ. මෙයට අරාබි භාෂාවෙන් "තල්බියාහ්" යනු කියනු ලැබේ.

لَبَّيْكَ اللَّهُمَّ لَبَّيْكَ، لَبَّيْكَ لَا شَرِيكَ
لَكَ لَبَّيْكَ، إِنَّ الْحَمْدَ وَالنِّعْمَةَ لَكَ
وَالْمُلْكَ لَا شَرِيكَ لَكَ

***ලෙබ්බයික් අල්ලාහුම්ම ලෙබ්බයික්***
***ලෙබ්බයික් ලා ෂරීක්කලක ලෙබ්බයික්***
***ඉන්නල් හම්ද වන්නිඃමත ලකවල්මුල්ක්***
***ලා ෂරීක්කලක්***

**තේරුම** : "මම පැමිණියෙමි: යා අල්ලාහ්! මම පැමිණියෙමි; මම පැමිණියෙමි: ඔබට කොටස්කරුවෙක් නැත: මම පැමිණියෙමි: නිශ්චය වශයෙන්ම ප්‍රශංසා සියල්ල, වරප්‍රසාද සහ ආධිපත්‍යය ඔබ සතුය: (නැවතත් කියමි) ඔබට කොටස්කරුවෙක් නැත."

ඉහ්රාම් ඇඳ සිටින්නෙක් අවස්ථාවක් ලැබුනු

---

12. "ලෙබ්බයික උම්රතන්": තේරුම - "මම උම්රා ඉටු කිරීමට පැමිණියෙමි" යන්නය.

සෑම විටකම විශේෂයෙන් කාලය හා ස්ථානය වෙනස්වන විට තල්බියාහ් කිව යුතුයි. උදාහරණයක් වශයෙන් යමෙක් තම ගමනේ දී කන්දක් නගින්න බහින්න වූ විට හෝ දිවා රාත්‍රී කාලය මාරුවනවිට හෝ තල්බියාහ් කීම ගතහැක. එකල් හි අල්ලාහ්ගේ තෘප්තිය හා ස්වර්ගය ආයාචනා කළ යුතුයි. තවද, අල්ලාහ්ගේ කරුණාව තුළින් නිරයෙන් බේරන ලෙසද බැගෑපත්ව ඉල්ලා සිටිය යුතුයි.

යමෙක් ඉහ්රාම් ඇඳගත්තේ නම් එතැන් පටන් තවාෆ් ඉටුකරනතෙක් තල්බියාහ් කීම අවශ්‍යයයි. එමෙන් ම, හජ්හිදී ඉහ්රාම් ඇඳගත් අවස්ථාව පටන් ඊද් උත්සව දින ජම්රතුල් අඛබාවෙහි දී ගල් ගසනු දක්වා ම තල්බියාහ් කිව යුතුයි.

උම්රා හෝ හජ් කර්තව්‍යය ඉටුකරන්නෙක් තම දකුණු පය පළමුවෙන් තබා ශුද්ධ වූ මස්ජිදයට[13] පිවිසිය යුතුයි. එහිදී ඔහු මෙසේ ප්‍රාර්ථනා කළ යුතුයි.

[بسم الله والصلاة والسلام على رسول الله، اللهم اغفر لي ذنوبي وافتح لي أبواب رحمتك، أعوذ بالله العظيم وبوجهه الكريم وبسلطانه القديم من الشيطان الرجيم].

13. මස්ජිද් : මුස්ලිම්වරුන්ගේ පල්ලිය.

***බිස්මිල්ලාහ්, වස්සලාත්තු වස්සලාමු අලා රසූලිල්ලාහ්: අල්ලාහුම්මඃපිර්ලී දුනූබී වෆ්තහ් ලී අබ්වාබ රහ්මතික්: අඌදු බිල්ලාහිල් අදීම්, වබී වජ්හිල් කරීම්, ව සුල්තානිහිල් කදීම් මිනශ් ෂයිතානිර් රජීම්.***

**තේරුම :** "මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙනි. සාමය හා වරප්‍රසාදය අල්ලාහ්ගේ වක්තෘවරයාණන් හට හිමිවේවා. යා අල්ලාහ්! මගේ පව් කමාකර ඔබගේ කරුණාවේ දොරටුව මා වෙනුවෙන් විවෘත කරන්න. ශාපයට ලක් වූ ෂෙතාන්ගේ බලපෑමෙන් බේරීම සඳහා සර්ව බලධාරීත්වයෙන් යුත්, විශිෂ්ඨ පෙනුම හා සර්වාධිපත්‍යය හිමි ඔබගේ පිහිට පතමි."

මෙම ප්‍රාර්ථනාවෙන් පසුව ඔහු කළුගල ළඟට විත්, එය තම දකුණතින් අල්ලා සිඹිය යුතුයි. එසේ බැරිවුයේ නම් එය දෙසට හැරී තම අත පෙන්වීම සෑහේ.

ඔහු එහි සිටින අනෙක් අයට හිංසා පීඩා නොකළ යුතුයි. අනෙක් අය තල්ලුකරගෙන ඉදිරියට යෑමට හෝ බලහත්කාරයෙන් යමක් කිරීමට හෝ තැත්කිරීමෙන් වැළකී සිටිය යුතුයි.

එම කළුගල අල්ලනවිට ඔහු මෙසේ කිව යුතුය:

بسم الله والله أكبر اللهم إيماناً بك وتصديقاً بكتابك ووفاء بعهدك واتباعاً لسنة نبيك محمد ﷺ.

***බිස්මිල්ලාහි අල්ලාහු අක්බර්. අල්ලාහුම්ම ඊමානන්බික ව තස්දීකන් බි කිතාබික. ව වෆාඅන් බිඅහ්දික. ව ඉත්තිබාඅන්ලි සුන්නතන් නබීයික මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම්.***

**තේරුම** : "මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙනි. අල්ලාහ් අතිශ්‍රේෂ්ඨය. යා අල්ලාහ් ඔබ කෙරෙහි භක්තියෙන් යුතුව, ඔබගේ ග්‍රන්ථය (කුර්ආන්) කෙරෙහි දැඩි විශ්වාසය ඇතිව, ඔබහට ප්‍රේමය හා පක්ෂපාතීත්වය දක්වා, මුහම්මද් (සල්) තුමාගේ ආදර්ශය අනුව යන බව ප්‍රතිඥාදෙමි".

ඉනික්බිතිව, ඔහු තම වම්පැත්තේ "කෑබාව"[14] තිබෙන ලෙස එය වටේ ගමන් කිරීම ආරම්භ කළ යුතුයි. ඔහු රුක්නුල් යමානී[15] වෙත ළංවූ විට එය ඉඹින්නේ නැතිව, එතැන අත තබා පහත සඳහන් ලෙස ප්‍රාර්ථනා කළ යුතුයි.

---

14 කෑබාව : මක්කාවේ ඇති ප්‍රධාන ස්ථානය (බයිතුල්ලාහ්)

15.රුක්නුල් යමානි : කෑබාවේ යෙමනය දෙසට මුහුණලා ඇති කෝණය.

رَبَّنَآ ءَاتِنَا فِي ٱلدُّنْيَا حَسَنَةً وَفِي ٱلْأَخِرَةِ حَسَنَةً وَقِنَا عَذَابَ ٱلنَّارِ

***රබ්බනා ආතිනා ෆිද්දුන්යා හසනතන් ව ෆිල් ආහිරත්ති හසනතන් වකිනා අදබන්නාර්***

**තේරුම :** "අප ස්වාමීනි, මෙලොවත් අපට යහපත් දේ දෙන්න: එලොවත් අපට යහපත් දේ දෙන්න. අපා ගින්නෙන් ද අප මුදහරින්න." (අල් කුර්ආන් 2:201)

මෙම ප්‍රාර්ථනාව ඉදිරිපත්කරන ඔහු කළුගල පසුකර යන සෑම වතාවකම "අල්ලාහු අක්බර්" (අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය) යනු කිව යුතුයි. මෙලෙස කඃබාව තවාෆ් කරන ඔහුට උවමනා ප්‍රාර්ථනාවන් ඉදිරිපත් කිරීමටත්, අල්ලාහ්ව වැඩි වැඩියෙන් "දික්ර්" (මෙනෙහි) කිරීමටත්, අල් කුර්ආනය පාරායනා කිරීමටත් අනුමතිය ඇත. තවද, තවාෆ්, සයී, ජම්රාහ් හි ගල් ගැසීම යනාදිය ද අල්ලාහ් මෙනෙහි කිරීමට යොදගත් ක්‍රමයන්ය.

තවාෆ් හි දී පිරිමියෙක් ඉටුකළ යුතු කාර්‍ය දෙකක් ඇත.

1. තවාෆයේ ආරම්භයේ සිට අවසානය දක්වා "අල් ඉද්තිබා" පිළිපැදීමයි. යමෙකු තම ශරීරයේ උඩ කොටස වසන රෙද්දේ මැදපැත්ත ඔහුගේ දකුණත යටින් ගෙන, එහි කොණ්දෙක වම් අතේ උරඉස

දක්වා ගෙන එන කාර්‍යයට "අල් ඉද්තිබා" යනු කියනු ලැබේ. මේ මගින් දකුණු පැත්තේ උරඉස නොවැසේ. ඔහු තවාෆ් ඉටුකළ පසුව එම රෙද්ද පළමුව තිබුනුලෙස ගෙන ආ යුතුයි. මක්තිසාද යත්, ඉත්තිබා කළ යුත්තේ තවාෆ් හි පමණය.

2. පළමුවෙනි තුන්වටයේදී "අල් රම්ල්" කළ යුතුයි. යමෙක් ගමන් කරන විට කුඩා අඩිතබා වේගයෙන් යෑමට "අල්රම්ල්" යනු කියනු ලැබේ. අනෙක් සිවුවටය සාමාන්‍ය ලෙස ගමන් කළ යුතුය.

මෙලෙස, තවාෆ් හි හත්වටයම සක්මන් කර නිමවුවාට පසුව, එහි ඇති "මකාමේ ඉබ්රාහීම්" වෙත පැමිණ පහත සඳහන් කුර්ආන් පාඨය පාරායනා කළ යුතුයි.

وَٱتَّخِذُوا۟ مِن مَّقَامِ إِبْرَٰهِـۧمَ مُصَلًّى

**වත්තහිදූ මින්මමකාමි ඉබ්රාහිම මුසල්ලා**

**තේරුම :** " ඉබ්රාහිම්යාවන්දා කිරීම සඳහා සිටගත් මෙම ස්ථානය නැමදුම් තැනක් ලෙස වෙන් කරගන්න" (අල්කුර්ආන් 2: 125)

පසුව, එම මකාමේ ඉබ්රාහිම් හි පිටුපසින් හැකිතරම ලඟා වී ඔහු රකඅත් දෙකකින් සමන්විත

ව සලාතය ඉටු කළ යුතුයි. මෙහිදී, පළමුවෙනි රකඅත්හි (සූරා ෆාතිහාවට පසු) "සූරා අල් කාෆිරූන්" සහ දෙවෙනි රකඅත්හි (සූරා ෆාතිහාවට පසු) "සූරා අල් ඉඛ්ලාස්" පාරායනා කළ යුතුයි.

සූරා ෆාතිහාව මෙසේය:

بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ ۝١

اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ ۝٢ الرَّحْمٰنِ

الرَّحِيْمِ ۝٣ مٰلِكِ يَوْمِ الدِّيْنِ ۝٤ اِيَّاكَ

نَعْبُدُ وَاِيَّاكَ نَسْتَعِيْنُ ۝٥ اِهْدِنَا الصِّرَاطَ

الْمُسْتَقِيْمَ ۝٦ صِرَاطَ الَّذِيْنَ اَنْعَمْتَ عَلَيْهِمْ

غَيْرِ الْمَغْضُوْبِ عَلَيْهِمْ وَلَا الضَّآلِّيْنَ ۝٧

*බිස්මිල්ලා හිර්රහ්මා නිර්රහීම්*

*අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්. අර්රහ්මා නිර්රහීම්*

*මාලිකි යව්මිද්දීන්. ඉය්යාක නඃබුදු ව ඉය්යාක නස්තඊන්.*

***ඉහ්දිනස් සිරාතල් මුස්තකීම්. සිරාතල්ලදීන අන්***
***අම්ත්ත අලෙයිහිම්***
***ගෑයිරිල් මග්දූබි අලෙයිහිම් වලද් දල්ලීන්***
***(අල්කුර්ආන් -සූරා 01)***

**තේරුම** : මහා දයාන්විත, මහා කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි. විශ්වයාධිපති වූ මහා දයාන්විත, මහා කරුණාන්විත, විනිශ්චය දිනයේ අධිපති වූ අල්ලාහ්ට පමණක් සියලු ප්‍රශංසාවන් අයත් වේ. ඔබ පමණක් අපි ඉබාදත් කරමු. (පුදමු) ඔබගෙන් පමණක් පිහිට පතමු. ඔබගේ ආශිර්වාදය ලද්දාවූ, ඔබගේ කෝපය නොලද්දාවූ, නොමග නොගියවුන්ගේ මාර්ගය වූ සෘජු මාර්ගය අපට දක්වනු මැනව.

සූරා අල් කාපිරුන් මෙසේය:

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

قُلْ يَٰٓأَيُّهَا ٱلْكَٰفِرُونَ ﴿١﴾ لَآ أَعْبُدُ مَا تَعْبُدُونَ ﴿٢﴾
وَلَآ أَنتُمْ عَٰبِدُونَ مَآ أَعْبُدُ ﴿٣﴾ وَلَآ أَنَا۠ عَابِدٌ مَّا عَبَدتُّمْ ﴿٤﴾
وَلَآ أَنتُمْ عَٰبِدُونَ مَآ أَعْبُدُ ﴿٥﴾ لَكُمْ دِينُكُمْ وَلِىَ دِينِ ﴿٦﴾

***බිස්මිල්ලා හිර්රහ්මා නිර්රහීම්***
***කුල් යාඅයියුහල් කාපිරූන්. ලා අඃබුදු මා තඃබුදූන්. වලා අන්තුම් ආබිදූන මා අඃබුද්. වලා අන ආබිදුම් මා අබද්තුම්. වලා අන්තුම් ආබිදූන මා අඃබුද්. ලකුම් දීනුකුම් වලියදීන්***
***(අල්කුර්ආන් - සූරා 109)***

**තේරුම :** මහා දයාන්විත, මහා කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි. පවසන්න! ඕ ප්‍රක්ෂේප කරන්නෙනි (කාපිර්වරුනි)! ඔබ වඳින දේ මා නොවඳිමි. මා වඳින්නා (අල්ලාහ්) ඔබලා වඳින්නේ ද නැත. තවද, ඔබ වඳින දේවල් මම වඳින්නෙක් නොවෙමි. තවද, මා වඳින්නා (අල්ලාහ්) ඔබද වඳින්නේ නැත. ඔබලාට ඔබලාගේ මාර්ගය (ධර්මය) මට මගේ මාර්ගය (ධර්මය) වේ.

සූරා අල් ඉක්ලාස් මෙසේය:

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

قُلْ هُوَ ٱللَّهُ أَحَدٌ ١ ٱللَّهُ ٱلصَّمَدُ ٢ لَمْ يَلِدْ
وَلَمْ يُولَدْ ٣ وَلَمْ يَكُن لَّهُۥ كُفُوًا أَحَدٌۢ ٤

***බිස්මිල්ලා හිර්‍රහ්මා නිර්රහීම්.***
***කුල් හුවල්ලාහු අහද්. අල්ලාහුස් සමද්. ලම් යලිද්***

**වලම් යුලද්. වලම් යකුන්ල්ලහු කුපුවන් අහද්**
**(අල්කුර්ආන් - සූරා 112)**

**තේරුම:** මහා දයාන්විත, මහා කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි. පවසන්න: අල්ලාහ් එක් කෙනෙකි. අල්ලාහ් කිසිදු අවශ්‍යතාවයක් නොමැත්තෙකි. ඔහුට (කිසිවෙක්) ඉපදුනේද නැත. වෙනත් කෙනෙකුට දුව (ඔහු) උපන්නේ ද නැත. තවද, ඔහුට සමාන කිසිවෙකු නැත.

ඉහත සඳහන් සූරා පාරායනා කර රකඅත් දෙකක සලාතය ඉටුකළ පසු එහි ඇති කළුගලට සමීප වී - පහසු නම් එය ඇල්ලීම යහපත්ය.

ඉනික්බිතිව ඔහු "මෙසාඅ" නම් වූ සක්මන් කිරීමෙහි යෙදීමට අස්සෆාවට[16] ළඟාවූ විට පහත සඳහන් කුර්ආන් පාඨය පාරායනා කළ යුතුය.

إِنَّ ٱلصَّفَا وَٱلْمَرْوَةَ مِن شَعَآئِرِ ٱللَّهِ

**ඉන්නස් සෆා වල් මර්වත මින් ෂාආඉරිල්ලාහ්**

**තේරුම :** "අල්ලාහ්ගේ චිහ්නයන් (symbols) අතර නියැකයෙන්ම සෆා හා මර්වා වෙයි. (අල්කුර්ආන් 2: 158)

---

16. අස්සෆා - "සයී" සක්මන් කිරීමේදී හමුවන එක් කඳුගැටයක්

අනතුරුව, ඔහු කෑබාව හොඳහැටි පෙනෙන තෙක් අස්සෆා කඳු ගැටයට නැගිය යුතුයි. එහිදී කෑබාව දෙසට හැරී අත්දෙක ඔසවා අල්ලාහ් ප්‍රශංසාකර ඔහුට උවමනා ප්‍රාර්ථනාවක් කිරීමට හැක. මෙහිදී නබි මුහම්මද් (සල්) තුමා, "ලා ඉලාහ ඉල්ලල්ලාහ්" (අල්ලාහ් හැර වෙන දෙවිකෙනෙක් නැත) යනු තුන්වරක් කීමත් සමගම ප්‍රාර්ථනා කළහෙයින්, මොහු ද මෙසේ කිරීම උතුම්ය.

පසුව, සෆාවෙන් බැස කොළපාට ලකුණතෙක් "අල් මර්වා"[17] දෙසට සාමාන්‍ය අඩිතබා ගමන් කළ යුතුය. එම කොළපාට ලකුණ පසුකරත්ම එතැන්සිට අනෙක් කොළපාට ලකුණ දක්වා වේගයෙන් ගොස්, එතැන් සිට නැවත සාමාන්‍ය අඩිතබා "අල් මර්වා" වට යායුතුය. එහි අල් මර්වාවට නැග අස්සෆාවෙහි කළමෙන් කෑබාව දෙසට හැරී, අත් ඔසවා, අල්ලාහ්ට ප්‍රශංසාකර, තමන්ට උවමනා ප්‍රාර්ථනාවන් කළ යුතුය. ඉන්පසුව අල් මර්වාවෙන් බැස අස්සෆා වෙත යා යුතුය. ඔහු කොතැනෙහි සාමාන්‍යයෙන් ගමන් කළ යුතුද, කොතැනෙහි වේගයෙන් දිව යුතුද යන්න දැනගෙන එය එසේම කළ යුතුය.

මෙලෙස ඔහු හත්වටයක්ම සක්මන් කළ යුතුය. අස්සෆා සිට අල් මර්වා දක්වා යෑම එක් වරක් වේ. නැවත අස්සෆා දක්වා ඒම එක් වරක් වේ. මෙයට

---

17 අල් මර්වා - "සයී" සක්මන් කිරිමේදී හමුවන අනෙක් කඳු ගැටය.

"සයී" යනු කියනු ලැබේ. මෙම සක්මන් කිරීමේදී උමවනා ප්‍රාර්ථනාවක් කිරීමටත්, කුර්ආනය පාරායනා කිරීමටත් අල්ලාහ් මෙනෙහි කිරීමටත් හැක.

"සයී" ය නිම වූ පසු ඔහු තම හිස කෙස් බූ ගෑසිය යුතුය. හිසකෙස් බූ ගෑවීම ය ඉතා අගේ. නමුත් හජ් කර්තව්‍යය ඉටුකිරීම ළඟදීම ඇත්නම් එම අවස්ථාවේ බූ ගෑවීම සඳහා කෙස් වැඩීමට කාලය මදිය. එමනිසා මෙහිදී කෙස් කොටට කැපිය හැක. ස්ත්‍රීන් ඇඟිලිතුඩු තරම තම හිසකෙස් කැපිය යුතුය. මෙම කාර්‍ය්‍යයන් සමග උම්රා නිමවේ. ඉන්පසු ඔහු තම ඇඳුම් මාරුකර ගැනීමටත්, සුවඳ විලවුන් පාවිච්චි කිරීමටත්, (විවාහක නම්) ලිංගික සබඳකම් තබා ගැනීමටත්, ඉස්ලාමයේ අනුමතිය ඇති අනෙක් කාර්‍ය්‍යයන් හි යෙදීමටත් අනුමතිය ඇත.

# 3. හජ්

දුල් හජ් මස අටවෙනි දින පෙරවරුවේ, හජ් කරන්නා තමා නැවතී සිටින ස්ථානයෙහිම, පහසුනම්, උම්රා සඳහා ස්නානය කරනවාමෙන් කර පිරිසිදු විය යුතුය. පසුව ඔහු ඉහ්රාම් ඇඳ "ලෙබ්බයික්ක හජ් ජන්" යනු නියියතය තබාගෙන "ලෙබ්බයික් අල්ලාහුම්ම ලෙබ්බයික්, ලෙබ්බයික්ලා ශරීකලක ලෙබ්බයික්. ඉන්නල් හම්ද වන්නිඃමත්ත ලකවල්මුල්ක් ලා ශරීකලක්" යනුවුතල්බියාහ්ව කීමට පටන්ගත යුතුය.

ඔහුට තම හජ් කර්තව්‍යය සම්පූර්ණයෙන් ඉටුකිරීමෙහි යම් බාධාවක් ඇතිවෙයිදෝ යනු බියක් ඇත්තේ නම් තම නියියතයෙහි කොන්දේසියක් තබාගත හැක. "කොතැනෙහි හෝ මට යම් බාධාවක් ඇතිවුවහොත් එතැන්හිම මම මෙම හජ් කර්තව්‍යය කටයුතු නවත්වමි" යන්න මෙම කොන්දේසිය වේ. ඔහුට ඉහත සඳහන් ලෙස යම් බියක් නැතිනම් මෙම කොන්දේසිය ද අවශ්‍යවන්නේ නැත.

හජ් කරන්නා මිනාවට ගියවිට, එහි දී ලුහර්, අසර්, මඃරිබ් සහ ඉෂා සලාත් ඉටුකළ යුතුයි. රකඅත් සතරක් ඇති සලාතයන් රකඅත් දෙකක් ලෙස කෙටිකර ඉටුකිරීමට හැක. නමුත් (ලුහර් සහ අසර්, මඃරිබ් සහ ඉෂා) එකටයාකර ඉටුකිරීම කළ නොහැක.

පසුදින ඉර උදාවීමත් සමගම ඔහු අරෆාත්

යායුතුයි. එහිදී ලුහර් සලාතයට නියමිත වේලාවෙහි ලුහර් හා අසර් සලාතයන් කෙටිකර එකට ඉටුකිරීමෙන් පසුව, පහදුනම්, ඉර බැසයනතුරු නමීරා මස්ජිදයෙහි නැවතී සිටීම වැදගත්ය. මෙහිදී අල්ලාහ් මෙනෙහි කරන අතර "කිබ්ලා"[18] ව දෙසට හැරී හැකි තරම් ප්‍රාර්ථනාවන් හි යෙදී සිටිය යුතුයි.

නබි (සල්) තුමාණන් මෙහි දී මෙසේ ප්‍රාර්ථනා කර ඇත:

"ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලාෂරීක්කලහු
ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව
අලාකුල්ලි ෂෙයිඉන් කදීර්" එනම්,

"අල්ලාහ් හැර (වැඳුම්පිදුම් කිරීමට) වෙන දෙවිකෙනෙක් නැත. ඔහුට කොටස් කරුවෙක් නැත. සම්පූර්ණ ආධිපත්‍යය හා ප්‍රශංසාව ඔහුට හිමිය. සෑමදෙයක් කෙරෙහිම ඔහුගේ බල මහිමය පවත්නේය." යනු තේරුමවේ. (මෙම ප්‍රාර්ථනාවද යෙදෙනු කළ හැක)

ඔහු (මෙම කාර්‍යයන්හි) වෙහෙසට පත්වූයේ නම්, එම ස්ථානයේ සිටින අනෙක් අය සමග ප්‍රයෝජනවත් සාකච්ඡාවන් හි යෙදීමට හෝ ගුණ දහම් වඩන පොත්පත් කියවීමට හෝ අනුමතිය ඇත. විශේෂයෙන් අල්ලාහ්ගේ මහිමය මෙනෙහිකර, ඔහුගේ ත්‍යාගයන් පිළිබඳ පොත්පත් කියවීම ඉතා උතුම්ය. මෙනයින් අල්ලාහ් සමඟ වූ බැඳීම හා බලාපොරොත්තුව ශක්තිමත් වන්නේය.

---

18. කිබ්ලා - මුස්ලිමුන් නැමදීම කරන්නේ මේ දෙසට හැරිය.

පසුව ඔහු ඉතා යටහත් පහත් ව හා බැගෑපත්ව ප්‍රාර්ථනාවෙහි යෙදෙයි. ප්‍රාර්ථනාවන්ගෙන් ඉතා වැදගත් බව සැළකෙන්නේ අරෆාත් දිනයෙහි ඉටු කරන ප්‍රාර්ථනාවන් ය.

එදින ඉර බැසීමත් සමග ඔහු අරෆාත් සිට මුස්තලිෆා යයි. එහිදී එදින මෑරිබ්, ඉෂා සහ පසුදින ෆජ්ර් සලාතයන් ඉටුකරයි. ඔහු වෙහෙසට පත් වී සිටින්නේ නම් හෝ ජලය සීමිතව ඇත්තේ නම් ඔහුට මෑරිබ් සහ ඉෂා සලාතයන් යාකර ඉටුකිරීමට හැක. මධ්‍යම රාත්‍රිය පසුවනතෙක් ම ඔහුට මුස්තලිෆාවට යෑමට බැරිවිය හැක යනු බියක් ඇත්තේ නම්, එහි පැමිණෙන තෙක් නොසිට සලාතය ඉටුකළ යුතුය. මක් නිසාද යත් මධ්‍යම රාත්‍රිය පසු වනතෙක් සලාතය පමාකිරීමට අනුමතිය නැත. පසුව ඔහු මුස්තලිෆාවෙහි නැවතී ප්‍රාර්ථනාවන් කරයි: අල්ලාහ් මෙනෙහි (දික්ර්) කරයි. මෙය ඉර උදවීම ලභාවනතුරුම ඔහු විසින් ඉටුවෙයි.

ඔහු "අර්රම්"[19] හි රැස්වෙන ජනයාගේ තෙරපීම් වැනි අපහසුතාවයන්ට මුහුණ පෑමට තරම් ශක්තිය නොමැත්තෙකු නම් ජමරාත් හි ජනයා රැස්වීමට පෙර ගල්ගැසීම සඳහා රාත්‍රි අග භාගයෙහි මිනාවට යෑමට අනුමතිය ඇත.

ඉර උදවෙන්න ලභාවෙන විට ඔහු මුස්තලිෆා සිට මිනාවට යායුතුයි. එහි ගියවිට පහත සඳහන්

---

19. අර්රම් - ගල් ගැසීමට මෙසේ කියනු ලැබේ.

කාර්‍යයන්හි ඔහු යෙදෙන්නේය.

අ) මක්කාවට ඉතා කිට්ටු ස්මාරකය වූ ජම්රතුල් අඛබාහි පිළිවෙළට ගල් හතක් ගසයි. ඒ එක් එක් ගලක් ගසන කල්හි ඔහු 'අල්ලාහු අක්බර්' යනු කියයි.

ආ) ඔහු ගෙනගිය සතා කැපකරයි. එයින් සුළු කොටසක් තමාගේ ආහාරය ලෙස ගන්නා අතර අනෙක් කොටස දුප්පතුන්ට දෙයි. මුතමාතින්[20] හා කිරාන් ක්‍රමය අනුව හජ් කරන්නන් සතෙක් කැපකිරීම අනිවාර්‍ය වේ.

ඇ) ඔහු තම හිසකෙස් බූ ගෑසීම හෝ කොටට කැපීම කරයි. බූ ගෑසීම වඩාත් හොඳය. ස්ත්‍රීන් ඇඟිළිතුඩු තරම හිසකෙස් කැපිය යුතුය.

මෙම කාර්‍යය තුන පහසුනම් මෙම පිලිවෙලට කළ යුතුයි. නමුත් මෙම පිළිවෙල වෙනස් නොකළ යුතුමය යනු නියමයක් නොමැත.

මේ සමගම ඔහු ඉහ්රාම් වස්ත්‍රය අතහැර වෙනත් ඇඳුම් ඇඳගත හැක. එමෙන්ම ඉහ්රාම් ඇඳීමට පෙර අනුමතිය තිබූ (ඉහ්රාම් ඇඳ සිටිනවිට අනුමතිය නැතිව තිබූ) දේ කිරීමටද අනුමතිය ඇත.

නමුත් ලිංගික සබඳකම් ඇතිකර ගැනීමට අනුමැතිය

---

20. මුතමාති - තමත්තු ක්‍රමය අනුව හජ් ඉටුකරන්නාට මේ නම යෙදේ.

නොමැත.

පසුව, "තවාෆ් අල් ඉෆාද"[21] සහ "සයී" යෙන් සමන්විත හජ් කර්තව්‍යය ඉටුකිරීමට මක්කමට යායුතුයි. මක්කමට යෑමට පෙර සුවඳ විළවුන් තවරා ගැනීම නබි (සල්) තුමාණන්ගේ සුන්නාවක්ය. තවාෆ් සහ සයී නිසිලෙස ඉටුකළ පසු ඉහ්රාමයට පෙර ඔහුට අවසරව තිබූ සෑමයක්ම කිරීමට ඔහු අවසර ලබයි. (විවාහක ස්ත්‍රී පුරුෂයින්) ලිංගික සබඳකම් තබා ගැනීමට ද අවසර ඇත.

ඔහු "තවාෆ්" සහ "සයී" ය ඉටුකළ පසු එකළොස්වෙනි හා දෙළොස්වෙනි දිනයන් හි රාත්‍රිය ගතකිරීම සඳහා මිනාවට ආපසු එයි.

එකළොස්වෙනි, දෙළොස්වෙනි දින දෙකෙහි පස්වරුවේ ඔහු ජම්රත්[22] තුනෙහිම ගල් ගසයි. මක්කමට ටිකක් ඈතින් පිහිටි පළමුවෙනි ජම්රත් සිට ඔහු එම කාර්‍යය පටන් ගනී. පසුව දෙවෙනි ජම්රත් හි ද අන්තිමට ජම්රතුල් අඛබාවෙහිද එය ඉටුකරයි. එක් එක් ජම්රත් හි ගල් හත බැගින් පිළිවෙළට ගැසීම කරන ඔහු, ඒ සෑම ගලක්ම "අල්ලාහු අක්බර්" යනු ශබ්ද නගාගෙන ගසන්නේය. ඔහු පළමුවෙනි දෙවෙනි ජම්රත් හි ගල් ගැසීමෙන් පසු කිබ්ලාව දෙසට හැරී ප්‍රාර්ථනා කරයි. මෙම දවස් දෙක තුළ

---

21 තවාෆ් අල් ඉෆාද - හජ් වෙනුවෙන් ඉටුකරන තවාෆය (කඃබාව වටේ සක්මන් කිරීම) ට මෙසේ කියනු ලැබේ.
22. ජම්රත් - මිනාවෙහි වූ ස්මාරකය

පෙරවරු කාලයේ ගල් ගැසීමට අවසර නැත. ජමිරත් දක්වා පයින් යෑම යහපත්ය. එමෙන්ම යම් සතෙකුපිට නැගී යෑම ට ද අවසර ඇත.

ඔහු දොළොස්වෙනි දින ගල් ගැසීමෙන් පසුව හදිස්සියක් ඇතොත් ඉර බැස යෑමට පෙර මිනාවෙන් පිටවී යෑමට හැක. නමුත්, එහි රැඳී සිටීමට

ඔහු කැමති නම් එය ඉතා යහපත්ය. එදින, එනම් දහතුන්වෙනි දින රාත්‍රිය මිනාවෙහි ගත කරන අතර දොළොස්වෙනි දිනමෙන් මෙදිනද පස්වරුවෙහි ගල් ගැසීම කළ යුතුය.

අනතුරුව, ඔහු තම රටට ආපසු යෑමට සූදනම් වූ විට, තවාෆ් අල් වදඃ[23] නම් වූ කඃබාව වටේ සත්වටයක් යෑම ඉටුකරයි. ඔසප්වීම හෝ දරු ප්‍රසූතයට පසු ලේ පිටවීම වැනි අපහසුතාවයන් ඇති ස්ත්‍රීන්ට තවාෆ් අල් වදඃ ඉටුකිරීම අනිවාර්‍ය නැත.

23. තවාෆ් අල් වදඃ - සමුගැනීමේ තවාෆයට මෙසේ කියනු ලැබේ.

# 4. නබිතුමාගේ මස්ජිදයට පිවිසීම.

1. හජ් කර්තව්‍යයට සහභාගිවන්නෙක් ඊට පෙර හෝ පසුව මදිනාවට යයි. එහි සලාත් කිරීමේ චේතනාවෙන් යුතුව නබි මුහම්මද් (සල්) තුමාගේ මස්ජිද (මස්ජිදුන් නබවි) යට පිවිසෙයි. මක්කමෙහි ඇති ශුද්ධ වූ මස්ජිදය හැර මෙම මස්ජිදුන් නබවියෙහි එක් සලාතයක් ඉටුකිරීම වනාහි වෙනත් ස්ථානයක සලාත් දහක් ඉටුකිරීමට වඩා උතුම් ය.

2. මෙම මස්ජිදුන් නබවියට ඔහු පැමිණිවිට "තහයියතුල් මස්ජිද්"[24] නම් වූ ආචාරශීලී සලාත් හෝ එම මොහොතට අදල අනිවාර්ය වූ සලාත් හෝ ඉටු කළ යුතුය.

3. ඉනික්බිතිව, ඔහු නබි (සල්) තුමාගේ ශුද්ධ වූ දේහය භූමදන කළ ස්ථානය ඉදිරියට එයි. එහිදී ඔහු මෙසේ ප්‍රාර්ථනා කළ යුතුයි.

«السلام عليك أيها النبي ورحمة الله وبركاته
صلى الله عليك وجزاك عن أمتك خيراً».

**අස්සලාමු අලයික්ක අයියුහන් නබියියු වරහ්මතුල්ලාහි ව බරකාතුහු සල්ලල්ලාහු අලයික්ක ව ජදක්ක අන් උම්මතිකඃහයිරන්**

තේරුම : "අස්සලාමු අලෙයිකුම් වරහ්මතුලාහි වබරකාතුහු යාරසූ ලුල්ලාහ්ඃ අල්ලාහ් ඔබතුමාගේ

24. තහයියතුල් මස්ජිද් - මස්ජිදයට ඇතුල්වීම නිමිත්තෙන් කරන සලාතය.

ජනයින් වෙනුවෙන් ඔබතුමාට යහපත් ත්‍යාගයන් පිරිනමත්වා."

පසුව ඔහු අඩියක් දෙකක් තමාගේ දකුණත පැත්තට ගොස් අබුබක්කර් (රළි) තුමාගේ භූමදාන ස්ථානය ඉදිරියේ සිට මෙසේ ප්‍රාර්ථනා කළ යුතුයි.

«السلام عليك يا أبا بكر خليفة رسول الله ﷺ ورحمة الله وبركاته رضي الله عنك وجزاك عن أمة محمد خيراً».

*අස්සලාමු අලයික්ක යා අබ්බක්ර් කලීෆත රසූලුල් ලාහි සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් වරහ්මතුල්ලාහි ව බරකාතු හු රලියල්ලාහු අන්ක ව ජදක්ක අන් උම්මති මුහම්මදි හයිරන්*

**තේරුම** : "අස්සලාමු අලෙයිකුම් වරහ්මතුල්ලාහි ව බරකාතුහු යා අබ්බක්ර් (රළි) තුමාණෙනි, රසූලුල්ලාහ් (සල්) තුමාගේ නියෝජිත වරයා වූ ඔබතුමා කෙරෙහි අල්ලාහ් සෑහීමට පත්වී, මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාගේ ජනයින් වෙනුවෙන් යහපත් ත්‍යාගයන් හිමි කරත්වා."

පසුව, ඔහු තවත් අඩියක් දෙකක් තම දකුණත

පැත්තට ගොස් උමර් (රළි) තුමාගේ භූමදන ස්ථානය ඉදිරියේ සිට මෙසේ ප්‍රාර්ථනා කළ යුතුයි.

«السلام عليك ياعمر أمير المؤمنين ورحمة الله وبركاته رضي الله عنك وجزاك عن أمة محمد خيراً».

***අස්සලාමු අලයික්ක යා උමර අමීරුල් මූඃමිනීන***
***ව රහ්මතුල්ලාහි ව බරකාතුහු රළියල්ලාහු***
***අන්ක ව ජදක්ක අන් උම්මති මුහම්මදි හයිරන්***

**තේරුම :** "අස්සලාමු අලෙයිකුම් වරහ්මතුල්ලාහි ව බරකාතුහු යා උමර්! විශ්වාසවන්තයන්ගේ නායකයානෙනි! මුහම්මද් (සල්) තුමාගේ ජනයින් වෙනුවෙන් අල්ලාහ් ඔබ කෙරෙහි සෑහිමට පත්වී, ඔබහට යහපත් ත්‍යාගයන් පිරිනමත්වා"

4. ඔහු තමන් ව යහපත් ලෙස පිරිසිදු කරගෙන සලාත් කිරීම සඳහා කුබා මස්ජිදයට යා යුතුයි.
5. පසුව, ඔහු අල් බකී[25] හි ඇති උද්මාන් (රළි) තුමාගේ භූමදන ස්ථානයට යායුතුයි. එහි ගොස් එය ඉදිරියේ සිට මෙසේ ප්‍රාර්ථනා කළ යුතුයි.

---

25. අල් බකී : මදිනාවේ එක් ස්ථානයක්.

«السلام عليك ياعثمان
أمير المؤمنين ورحمة الله وبركاته
رضي الله عنك وجزاك عن أمة
محمد خيراً. وسلّم على من في
البقيع من المسلمين».

***අස්සලාමු අලයික්ක යා උද්මාන අමීරුල් මූඃමිනීන ව රහ්මතුල්ලාහි ව බරකාතුහු රළියල්ලාහු අන්ක ව ජදක්ක අන් උම්මති මුහම්මදි හයිරන්***

**තේරුම** : "අස්සලාමු අලෙයිකුම් වරහ්මතුල්ලාහිව බරකාතුහු යා උද්මාන්!"
විශ්වාසවන්තයන්ගේ නායකයාණෙනි, මුහම්මද් (සල්) තුමාගේ ජනයින් වෙනුවෙන් අල්ලාහ් ඔබ කෙරෙහි සෑහීමට පත් වී, ඔබහට යහපත් ත්‍යාගයන් පිරිනමත්වා."

ඔහු මෙසේ ප්‍රාර්ථනා කිරීමෙන් පසුව අල් බකීහි භූමදන කරනු ලැබ ඇති අනෙක් මුස්ලිම් බැතිමතුන්ට ද ආචාර කරයි.

පසුව, ඔහු උහද් [26] නම් වූ ස්ථානයට ගොස් එහි

---

26 උහද් : මදිනාවට තුදුරින් ඇති කඳුගැටයකි. මෙහි හටගත් යුද්ධයක ට ද මෙම නම ව්‍යවහාර වේ.

භූමදාන කර ඇති හම්සා (රලි) තුමා ඇතුළු අල්ලාහ් වෙනුවෙන් දිවිපිදූ අනෙක් උතුම් අයගේ භූමදාන ස්ථානයන් ඉදිරියේ සිට, ඔවුන්ට ආචාර කර ඔවුන්ගේ පව් කමාකර, කරුණාව හා සොම්නස දක්වනමෙන් අල්ලාහ් ගෙන් ප්‍රාර්ථනා කළ යුතුය.

# 5. දැනගත යුතු වැදගත් කරුණු

හජ් සහ උම්රා ඉටුකරන මුහ්රිම්හු[27] පහත සඳහන් කරුණු දැනගැනීම වැදගති.

1) ඔවුන්වෙත පැවරී ඇති, අල්ලාහ් වෙනුවෙන් ඉටු කළයුතු සලාත් වැනි ආගමික වතිවතාවන් ඒ සඳහා වූ නියමිත කාලයන් තුළ ඉටුකළ යුතුය. (පිරිමින් සලාතය සාමුහිකව කළ යුතුය.)

2) අල්ලාහ් විසින් "යහපත් නැත" කියා තහනම් කර ඇති නින්දිත, අයුක්ති සහගත, අකීකරු ක්‍රියාවන් සම්පූර්ණයෙන්ම අත්හැරිය යුතුයි.

අල්ලාහ් මෙසේ පවසයි.

".....හජ් ඉටුකිරීමට අධිෂ්ඨාන කරගන්නා කවරෙකු වුවද, සියලුම ආකාරයේ ලිංගික ආස්වාදයන්ගෙන්, අශිෂ්ඨකම්වලින්, හා වාදභේදදියෙන් මුළුමනින්ම වැළකී සිටිනු මැනවි".

(අල් කුර්ආන් 2: 197)

3) ඔවුන් අනෙක් මුස්ලිම් සහෝදර සහෝදරියන් හට වචනයෙන් හෝ වෙනත් ක්‍රියාවලින් හෝ නින්ද නොකළ යුතුයි.

---

27. මුහ්රිම් - ඉහ්රාමය ඇඳසිටින කෙනෙකුට මෙම නම යෙදේ.

4) ඉහ්රාමයේ කොන්දේසි නිසිලෙස පිළිපැදිය යුතුයි.

අ) හිසකෙස් හෝ නියපොතු වැටෙන ක්‍රියාවන් නොකළ යුතුයි. නමුත්, කටුවක් ශරීරයේ ඇනීමෙන් හෝ එයින් ලේ පිටවීමෙන් හෝ ප්‍රශ්නයක් නොමැත.
ආ) ඉහ්රාම් ඇඳගත් පසු තම ශරීරයේ හෝ ඇඳුම් වල හෝ සුවඳ විලවුන් තවරා ගැනීම, කෑම්බීම්වල පාවිච්චි කිරීම යනාදිය නොකළ යුතුයි. සුවඳ සබන් පාවිච්චි කිරීමෙන්ද වැළකී සිටිය යුතුයි. ඉහ්රාම් ඇඳීමට පෙර පාවිච්චිකළ සුවඳ විලවුන් වලින් වූ සුගන්ධය ඉහ්රාමය ඇඳීමෙන් පසුවද රැඳී තිබීම වරදක් නොවේ.
ඇ) ඔවුන් තම බිරියන් සමග සිතේ ආශාවෙන් හැසිරීම, සිඹීම හෝ ලිංගික ආස්වාදයන්හි යෙදීම යනාදියෙන් වැලකී සිටිය යුතුයි.
ඈ) ඔවුන් විවාහ වීම, තමන්ට හෝ තවත් කෙනෙකුට විවාහ කරගැනීමට ස්ත්‍රියක් යෝජනා කිරීම නොකළ යුතුයි.
ඉ) ඔවුන්, තම අත රෙදි කැබැල්ලකින් ඔතාගැනීමට අවසර ඇතත් අත්මේස් (GLOVES) පාවිච්චි නොකළ යුතුයි.

ඉහත සඳහන් කරුණු ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයට ම පොදුය. පහත සඳහන් කරුණු පිරිමින් වෙනුවෙන් පමණක් විශේෂයෙන් ගෙන දක්වමි.

අ) ඔවුන් තමාගේ හිසට ගැවෙන සේ හිස්වැසුම් පාවිච්චි නොකළ යුතුය. නමුත්, සෙවනැල්ල තකා කුඩ හෝ වාහනයක්, නැත්නම් කුඩාරම් ආදිය පාවිච්චි කිරීම වැරදි නොවේ. තවද ඔවුන්ට අයිති බඩුමුට්ටු සහිත වූ පොදි හිසමත තබාගෙන යෑම වැරදි නොවේ.

ආ) ඔවුන් කමීස, තොප්, හිසවැස්ම සහිත කලිසම් හෝ සපත්තු කුට්ටම් පාවිච්චි කළ නොහැක. සමහරවිට "ඉෂාර්" නම් වූ ඉහ්රාමයේ පහත කොටස හෝ සෙරෙප්පු ලබාගන්න නුපුළුවන් වුවහොත් පමණක් කලිසම් හෝ සපත්තු කුට්ටම් පාවිච්චි කළ හැක.

ඇ) ඔවුන් ඉහත සඳහන් දේ හා සම්බන්ධවන හිස්වැසීම්, තොප්පි, අත්දිග කෝට්, යට ඇඳුම් වැනි දේද පාවිච්චි කළ නොහැක.

ඔවුන්, සෙරෙප්පු, මුදු., ඇස් කණ්නාඩි, ශබ්ද විකාශන භාණ්ඩ, අත් ඔරලෝසු වැනි අතේ බඳින කරේ එල්ලනු ලබන, පයේ දන දේ පාවිච්චි කිරීමට අවසර ඇත. සුවඳ නොකැවූ දේවලින් ඔවුන් තම ශරීරය පිරිසිදු කරගැනීමට හැක. ඔවුන්ගේ ශරීරය සහ හිස කැසීමට ද අවසර ඇත. නොදැනුවත්වම (සිතා මතා නැතිව) හිසකෙස් වැටීමද වැරදි නැත. මෙවැනි දේ සඳහා අනිවාර්යයෙන් කළ යුතු වෙනත් කාර්යයන් ද නොමැත.

ස්ත්‍රීන් බුර්කා, නිකාබ් වැනි මුහුණ වසන දේ

පාවිච්චි කිරීමට බැරිය. සුන්නාව නම් මුහුණ නොවසා සිටීමය. සමහරවිට තම නැදෑයින් හැර වෙනත් පිරිමින් බලන බව දක්නට ලැබෙන්නේ නම් මුහුණ වැසිය හැක. මෙවැනි තත්වයක - ඉහ්රාම්හි හෝ වෙනත් අවස්ථාවක වුවත් මුහුණ වැසීම අනිවාර්ය වේ.

අල්ලාහ් පමණය ජය හා සතුට ගෙන දෙන්නා. ඔහුටය සියලු ප්‍රශංසා හිමිවන්නේ. මුහම්මද් (සල්) තුමාණන්ට හා එතුමාගේ පවුලේ සැවොමටත්, එතුමාගේ අනුගාමිකයන්ටත් අල්ලාහ්ගේ ආශිර්වාද ලැබේවා.

مطابع الحميضي
تلفون : ٤٥٨١٠٠٠ - فاكس : ٤٥٩٢٢١٧

حقوق الطبع ميسرة لكل مسلم يريد توزيعه لوجه الله
أما من أراد بيعه فعليه الاتصال بالمكتب
هاتف : ٤٣٣٠٤٧٠ - ٤٣٣٠٨٨٨

# صفة الحج والعمرة

تأليف

فضيلة الشيخ / محمد بن صالح العثيمين

تَرجمَهُ للسنهالية

شريف الدين محمد منصور

# صفة الحج والعمرة

تأليف

فضيلة الشيخ / محمد بن صالح العثيمين

ترجمه للسنهالية

شريف الدين محمد منصور

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالسلي

ص.ب ١٤١٩ الرياض ١١٤٣٠ هاتف ٢٤١٤٤٨٨ - ٢٤١٠٦١٥ ناسوخ ٢٤١١٧٢٢

٥ / ١ سنهالي